# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

# ආරක්ෂක අමාත්‍යාංශය

## ස්ථාවර කිරීමේ ක්‍රමවේදය මගින් නායයෑමේ අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය

# ඇබෑර්තු

ශ්‍රී ලංකා රජය (GoSL) සහ ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (AIIB) විසින් අරමුදල් සැපයෙන ස්ථාවර කිරීමේ ක්‍රමවේදය මගින් නායයෑමේ අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය (RLVMMP) යටතේ ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුර සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ. ව්‍යාපෘතියෙහි වටිනාකම ඇමෙරිකානු ඩොලර් මිලියන 101.3 කි.

ආරක්ෂක අමාත්‍යාංශය සම්පාදනය කිරීමේ නියෝජිතායතනය ලෙස ක්‍රියා කරන අතර, ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ඇති ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය (NBRO) ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය ලෙස සේවය කරයි.

ව්‍යාපෘතියෙහි ඉලක්කය වන්නේ බදුල්ල, මහනුවර, මාතලේ, කෑගල්ල, රත්නපුර, නුවරඑළිය, කළුතර, කොළඹ, මාතර සහ කුරුණෑගල දිස්ත්‍රික්කයන්හි හඳුනාගත් ස්ථාන 128 ක මෙන්ම දුම්රිය මාර්ග සමග ඇති අස්ථාවර ප්‍රදේශයන්හි නාය යාමේ අවදානම අවම කිරීමයි. අදියර I යටතේ සාර්ථකව නාය යාමේ අවදානම සහිත තීරණාත්මක ස්ථාන අවමකර ඇති අතර, දැන් අදියර II යටතේ ඉතිරි අවම කිරීමේ ස්ථාන වෙත යොමුවෙමින් පවතියි.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ (තනතුරු 01-PS1)**

**අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද,**

ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුර කොන්ත්‍රාත් පදනම මත වන පූර්ණ කාලීන තනතුරක් වන අතර, ව්‍යාපෘතිය අවසන් වන දිනය සමගම කාලය අවසන් වේ. (මාස තුනක පරිවාස කාලයක් ඇතුළත්ව)

අයදුම්කරණ දිනට අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 64 ට අඩු විය යුතුය.

ව්‍යාපෘති ඇගයුම් ලිපි ලේඛන සහ තනතුර සඳහා වන විෂය ක්ෂේත්‍රය https://rlvmmp.lk/ වෙබ් අඩවියෙහි දක්වා ඇත.

විදේශ අරමුදල් ව්‍යාපෘතීන්හි පළපුරුද්ද සඳහා ප්‍රමුඛතාවය හිමි වේ.

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින්, පිළිගත්, අදාළ ක්ෂේත්‍රයේ මූලික උපාධියක් සාර්ථකව සම්පූර්ණකර තිබීම හෝ

   විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් හෝ

   අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වය/ සමාන වෘත්තීය සුදුසුකමක්

   සහ

   සුදුසුකම් ලැබීමෙන් පසු, අවම වශයෙන් වසර 14 ක කළමනාකරණ මට්ටමේ පළපුරුද්දක් තිබිය යුතු අතර, ඉන් වසර 07 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.

2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, අදාළ ක්ෂේත්‍රයේ මූලික උපාධියක් සාර්ථකව සම්පූර්ණකර තිබීම හෝ

   විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් හෝ

   අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වය/ සමාන වෘත්තීය සුදුසුකමක්

   සහ

   අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආයතනික/ වරලත් සාමාජිකත්වය හෝ සමාන වෘත්තීය සුදුසුකමක් හෝ අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් සමග

   සුදුසුකම් ලැබීමෙන් පසු, අවම වශයෙන් වසර 12 ක කළමනාකරණ මට්ටමේ පළපුරුද්දක් තිබිය යුතු අතර, ඉන් වසර 06 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.

3. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, අදාළ ක්ෂේත්‍රයේ මූලික උපාධියක් සාර්ථකව සම්පූර්ණකර තිබීම හෝ

   විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක්

   සහ

   අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් සමග

   අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආයතනික/ වරලත් සාමාජිකත්වය හෝ සමාන වෘත්තීය සුදුසුකමක් සමග

   සුදුසුකම් ලැබීමෙන් පසු අවම වශයෙන් වසර 10 ක කළමනාකරණ මට්ටමේ පළපුරුද්දක් තිබිය යුතු අතර, ඉන් වසර 05ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.

ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ අධ්‍යාපනික සුදුසුකම් (ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය සහ ඇගයීම) සහ විදේශීය අරමුදල් ව්‍යාපෘතීන් හි පළපුරුද්ද සඳහා ප්‍රමුඛතාවය හිමි වේ.

තනතුර සඳහා අදාළ වන වේතන සහ වෙනත් නියමයන් සහ කොන්දේසි 2019-03-05 දින මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු (MSD) චක්‍රලේඛ අංක 2019/1 හි දක්වා ඇත.

සේවායෝජකයා විසින් සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල (ETF) සඳහා 12% සහ 3%ක දායකත්වයක් ලබාදෙන අතර, EPF සඳහා සේවකයාගේ දායකත්වය 8% කි.

සම්පූර්ණ ජීවදත්ත පත්‍රිකාවක්, ඥාතීන් නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ සම්බන්ධතා තොරතුරු සහ අදාළ සහතිකවල සහතිකකරන ලද පිටපත් සමග දින 10 ක් ඇතුළත දී ලියාපදිංචි තැපැල හරහා අයදුම්කරන මෙන් යෝග්‍යතාපූර්ණ අයදුම්කරුවන් වෙතින් ඉල්ලා සිටිනු ලැබේ. අසම්පූර්ණ අයදුම්පත් හෝ අවශ්‍ය සුදුසුකම් පළපුරුද්ද හෝ උපකාරක සහතිකපත් සපුරා නොමැති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රාජ්‍ය සංවිධානයන්හි සේවකයන් සංවිධානයේ ප්‍රධානියා මාර්ගයෙන් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

කවරයෙහි ඉහළ වම් කෙළවරෙහි අයදුම්කරන තනතුර සඳහන් කළ යුතු අතර, අයදුම්පත් ලියාපදිංචි තැපැලෙන්, ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය, ආපදා කළමනාකරණ අංශය, විද්‍යා, මාවත, කොළඹ 07 වෙත එවිය යුතුය.

**ලේකම්,**
**ආරක්ෂක අමාත්‍යාංශය.**